## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 391

## ආයතනයේ නම : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 120(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 391

ආයතනයේ නම : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

| නිර්දේශ | ස්ථාවර නියෝග 120 (4) අනුව<br>නිරීක්ෂණ සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග / යෝජිත ක්‍රියා මාර්ග හෝ වෙනත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය |
|---|---|
| **2025.05.08 දින සාකච්ඡාවට ලක් කල කරුණු.** | |
| **01. සංයුක්ත සැලැස්ම**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I.වර්තමානයේ සිදු වී ඇති දේශපාලනික හා ආර්ථික ප්‍රතිපත්තිමය වෙනසකම් වලට අනුරූප වන පරිදි, ආයතනයේ නිලධාරීන් විසින් ආයතනයට වඩාත් සුදුසු, යාවත්කාලීන, සංයුක්ත සැලැස්මක් සකස් කිරීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>1.1 2025 – 2029 සඳහා වන සංයුක්ත සැලැස්ම සකස් කර අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇති අතර එය 2025.10.08 වන දින අනුමත කර ඇත.<br>1.2 සංයුක්ත සැලැස්මේ පිටපත් විගණකාධිපති හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2025.10.27 දින යොමු කර ඇත.<br>1.3 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙතද පිටපතක් 2025.11.06 දින යොමු කර ඇත (ඇමුණුම 01). |
| **02. අනුමත කාර්ය මණ්ඩලය හා බඳවා ගැනීම් ගැටලු**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I.මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සිදුකර ඇති බඳවා ගැනීම් සම්බන්ධයෙන් වූ සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ පහත ඇති කරුණු ද ඇතුළත් වන පරිදි නිශ්චිත විමර්ශනයක් සිදුකිරීම සහ නැවත ඒ සම්බන්ධයෙන් ගැටළු ඇති නොවන ආකාරයට බඳවා ගැනීමේ ගැටළු විසඳා ගැනීමට කටයුතු කිරීම.<br>• උක්ත බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් ආයතන වලින් අදාළ අනුමැතිය ලබා නොගැනීම සහා ආවරණ අනුමැතියට යටත්ව බඳවා ගැනීම සිදු කිරීම සම්බන්ධව, | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>2.1 අනුමත කාර්ය මණ්ඩලය හා බඳවා ගැනීම් ගැටලු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද අමාත්‍යාංශයීය විමර්ශන කමිටුවේ විමර්ශනය අවසන්ව ඇති අතර වාර්තාව ඉදිරිපත් කරන බව ඉඩම් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් දන්වා ඇත.<br>2.2 තවද, බඳවාගෙන ඇති සේවකයින් අධි සේවක පදනම මත තබා ගැනීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ පාලන විසින් දන්වා ඇත. |

| | |
|---|---|
| හා බඳවා ගැනීමේදී ආයතනයේ නිලධාරීන් විසින් සිදු කර ඇති වැරදි සම්බන්ධයෙන්,<br>• බඳවා ගැනීමට අදාළව දැන්වීම් පළ කළ ආකාරය ලැබූ අයදුම්පත් ගණන, පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය පිළිබඳ තොරතුරු, පත්වීම් ප්‍රදානය කිරීමට තෝරාගත ආකාරය, පත්වීම් ලාභීන්ගේ තොරතුරු,<br>• බඳවා ගැනීමේ අරමුණු ළඟා කරගෙන නොමැති නම් එයට හේතු,<br>• අනුමැතිය ඉක්මවා බඳවා ගැනීම් සිදු කිරීමට හේතු,<br>• අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබා දුන් කොමිෂන් සභා සාමාජිකයන් සහ වගකිව යුතු සියළුම නිලධාරී මණ්ඩලය පිළිබඳ තොරතුරු සහ ඒ ඒ අදාළ අදියර වලදී අනුමැතිය ලබා දුන් නිලධාරින් සම්බන්ධ තොරතුරු,<br>• උක්ත බඳවා ගැනීම්වලට අදාළ කාර්යභාරය ඉටු කිරීමට පටහැනිව මෙම සේවකයින්ගෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන්ගේ කාර්යයන් ඉටු කරගෙන තිබේද? එසේනම් ඒ සඳහා නියෝග ලබාදුන් නිලධාරීන් සම්බන්ධව<br>• මෙම සේවක බඳවාගැනීම් සම්බන්ධයෙන් අපේක්ෂිත අරමුණු, කාර්යභාරය ඉටු නොවීමට හේතු සහ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් උපලේඛන 03 අනුව කටයුතු කර තිබේද යන්න සලකා බැලීම,<br>• මෙම සේවකයන් මේ වන විට ඉටුකරන කාර්යභාර්ය සහ ඔවුන්ව ඵලදායීව යොදා ගැනීමට සැලසුමක් ඉදිරිපත් කිරීම, | **වර්තමාන තත්වය**<br>2.3 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ පරිදි අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ කමිටුවක් මඟින් විමර්ශනයක් සිදුකරමින් පවතී. |

| | |
|---|---|
| • අවශ්‍ය කාර්ය සාධනය ඉටු කර ගැනීමකින් තොරව මෙම සේවකයින් ස්ථිර කිරීම සිදු කළේ කෙසේද යන්න පිළිබඳව,<br>• මෙලෙස අනුමැතියකින් තොරව බඳවාගෙන මේවන විට ස්ථිර කළ සේවක සංඛ්‍යාව, ස්ථිර නොකල සංඛ්‍යාව, තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත් සේවයේ නිරතවන සේවක සංඛ්‍යාව, අනුමත කාර්යය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා තිබේනම් ස්ථිර කල හැකි සංඛ්‍යාව සහ අනුමත කාර්යය මණ්ඩලය තුළට අන්තර්ග්‍රහණය කර ගත හැකි හා නොහැකි තනතුරු සංඛ්‍යාව,<br>• අනුමත කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමේදී, බඳවා ගැනීමේ පරිපාටිය (SoR) අනුව කටයුතු කර තිබෙන බවට තහවුරු කර ගෙන නැවතත් ගැටළුකාරී තත්වයන් ඇති නොවන ආකාරයට කටයුතු කිරීම. | |
| **03. කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට තෝරා පත් කරගැනීමේ ක්‍රමවේදය කාරක සභාවේ නිර්දේශ**<br><br>I.2023.07.31 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා මාස 06 කට වඩා කාලයක් ඉකුත්ව ඇති බැවින්, නැවත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අදාළ බඳවා ගැනීම සිදු කරන ලෙස ලිඛිත නියෝගය ලබා දී තිබිය දී, කොමිෂන් සභාවේ අනුමැතිය මත 2024.04.08 වන දින කැඳවන ලද අයදුම්පත් මත සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා පූර්ව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම සහ එකී අයදුම්කරුවන්ට කිසිදු දැනුම්දීමක් සිදු | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br><br>3.1 අමාත්‍යාංශයීය පරීක්ෂණ කමිටුව විසින් වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ මත කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැඩ බැලීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කර ඇත.<br><br>**වර්තමාන තත්වය**<br><br>3.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය පරිදි අමාත්‍යාංශීය පරීක්ෂණ කමිටුව විසින් පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එහි නිර්දේශ පරිදි කොමිෂන් සභාව විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2019 යටතේ විනය |

| | |
|---|---|
| නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම.<br>II.කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම නිවැරදි ක්‍රමවේදය අනුව කඩිනමින් සිදු කිරීම. | පරීක්ෂණ නිලධර නාමලේඛනයේ නම සඳහන් නිලධාරියෙකු විසින් මූලික විමර්ශනයක් සිදු කරමින් පවතී. |
| **04. කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලින් මුදල් වියදම් කිරීම.**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I.මෙම සමස්ත ව්‍යාපෘතිය පිළිබඳ අමාත්‍යාංශය විසින් මේ වන විට පවත්වා ගෙන යමින් සිටින පරීක්ෂණය කඩිනමින් අවසන් කිරීම.<br>II. අදාළ කාබනික පොහොර ව්‍යපෘතිය යටතේ ව්‍යාපෘති කටයුතු සිදු කළ මධ්‍යස්ථාන 35 ට අදාළව මධ්‍යස්ථාන ලිපිනයන්, ව්‍යාපෘතියට සම්බන්ධ වූ ආයෝජකයින් පිළිබඳ තොරතුරු, බඳවාගත් සේවකයින් පිළිබඳ තොරතුරු සහ ඔවුන් බඳවාගත් ක්‍රමවේදය, මෙම මධ්‍යස්ථාන සඳහා දරන ලද පිරිවැය, ඉදිකළ ගොඩනැඟිලි, එම ගොඩනැගිලි ඉදි කළ ඉඩම්වල සන්තකය සම්බන්ධ තොරතුරු සහ ලබාදුන් උපකරණ පිළිබඳ තොරතුරු හා ඒවායේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීම.<br>III.එම පරීක්ෂණ වාර්තාව අදාළ නීතිමය කටයුතු සඳහා යොමු කිරීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>4.1 කාබනික පොහොර සම්බන්ධ අමාත්‍යාංශයීය පරීක්ෂණ කමිටු වාර්තාව ලැබී ඇත.<br>4.2 ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්තාව ඇමුණුම්ද සහිතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2025.07.08 දිනැතිව කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් මගින් විගණකාධිපති හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ටද පිටපත් සහිතව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කර ඇත (ඇමුණුම 02).<br>**වර්තමාන තත්වය/යෝජිත ක්‍රියාමාර්ග**<br>4.3 අමාත්‍යාංශයීය පරීක්ෂණ කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |
| **2025.07.17 දින සාකච්ඡාවට ලක් කළ කරුණු.** | |
| **05. කොමිෂන් සභාව සතු ඉඩම් දිස්ත්‍රික් අධ්‍යක්ෂ එන්. විමලරාජ් මහතා විසින් ඉඩම් නීති විරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් පැවැත්විය යුතු විනය පරීක්ෂණය** | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>5.1 නීතිපති දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලද සමතයට 2025.12.05 දිනැති |

| | |
|---|---|
| **කාරක සභාවේ නිර්දේශ**<br>I. කොමිෂන් සභාවේ දිස්ත්‍රික් අධ්‍යක්ෂක එන්. විමලරාජ් මහතා විසින් කොමිෂන් සභාව සතු ඉඩම් දාහකට වැඩි ප්‍රමාණයක් නීතිවිරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් 2023.04.26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ලබා දුන් නිර්දේශය ක්‍රියාත්මක කිරීම.<br>II. ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීමට එන්, විමලරාජ් මහතා විසින් අභියාචනාධිකරණයේ පවරා තිබූ රිට් පෙත්සමට අදාළව එම අධිකරණය විසින් ලබා දී ඇති වාරණ නියෝගය (Stay Order) බාධාවක් වන්නේද යන්න සොයා බැලීම. | ප්‍රතියෝජනාවක් ඉදිරිපත් කරන ලද අතර එම ප්‍රතියෝජනාවන් පිළිගැනීම නඩුවේ එළඹ ඇති කරුණු මත යුක්ති සහගත හා සාධාරණ වන බවට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විසින් පෙන්වා දෙන ලදී. අනතුරුව පූර්වෝක්ත සමතය 2025.12.18 දින පැවති කොමිෂන් සභාව වෙත අංක 13238 දරණ පත්‍රිකාව මත ඉදිරිපත් කරන ලද අතර එයට කොමිෂන් අනුමැතිය ලැබිණි.<br>5.2 එකී කොමිෂන් සභා අනුමැතිය නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වෙත 2025.12.22 දාතමින් යුතුව යොමු කර ඇත.<br>5.3 නඩුවේ යෝජිත සමථ කොන්දේසි වාර්තා කිරීම සඳහා 2026.02.23 දින දක්වා කල් ලබාගෙන ඇත. |
| **07. කොමිෂන් සභාව පවරාගත් ඉඩමක් වෙනුවට හන්තාන - ඌරාගල වත්තෙන් අක්කර 25 ක් ලබා දීම**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. මෙම අවිධිමත් පැවරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර, වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන එම නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>7.1 2025.10.10 දින පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට අනුව අමාත්‍යාංශ ලේකම් විසින් 2025.10.27 දින ප්‍රධාන අභ්‍යන්තර විගණක (ඉඩම් අමාත්‍යාංශය) - සභාපති, ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (ඉඩම්) - සාමාජික, නීති නිලධාරී (ඉඩම් අංශය) - සාමාජික සමන්විත කමිටුවක් පත් කර ඇති අතර කමිටු වාර්තාව 2025.11.30 දිනට පෙර බාර දෙන ලෙස උපදෙස් ලබා දී ඇත (ඇමුණුම 03).<br>7.2 එම කමිටුවට රාජකාරී බහුලත්වය හා මෙම ගැටළුවල ඇති නෛතික තත්වයන් ගැඹුරින් අධ්‍යනය කල යුතු බැවින් හා අපහසු බව පෙනීයන බැවින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා විශේෂඥ මණ්ඩලයක් පත් |

| | |
|---|---|
| | කිරීමට කටයුතු කිරීමට අතිරේක ලේකම් (පාලන) වෙත 2025.11.26 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් දී ඇත.<br><br>**වර්තමාන තත්වය**<br>7.3 ඒ අනුව අමාත්‍යාංශ මට්ටමින් මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට නව කමිටුවක් පත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **08. ඉඩම් ලේඛනය අනුව බදු දී ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම් වල සමස්ත වටිනාකම**<br><br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් මැනීම කඩිනමින් අවසන් කිරීම සහ බදු දී ඇති ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීම.<br>II. එම කටයුතු සඳහා අදාළ ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහය ලබා ගැනීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>8.1 දැනට iLAS මෘදුකාංගය භාවිතා කර ගූගල් සිතියම මත සිතියම්ගත කිරීම ආරම්භ කර දැනට ක්ෂේත්‍රයේ හඳුනාගෙන ඇති ඉඩම් 320 කින් ඉඩම් 125 ක පොලිගන් සකස් කර ඇත.<br><br>8.2 බදු දී ඇති ඉඩම් ප්‍රමාණය සහ සමස්ථ ඉඩම් වල වටිනාකම තක්සේරු කිරීමට අදාල යෝජනා පත්‍රය හා ක්‍රියාත්මක සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.<br><br>**වර්තමාන තත්වය**<br>8.3 iLAS මෘදුකාංගය භාවිතා කර ගූගල් සිතියම මත සිතියම්ගත කිරීම ආරම්භ කර දැනට ක්ෂේත්‍රයේ හඳුනාගෙන ඇති ඉඩම් 320 කින් ඉඩම් 291 ක (91%) පොලිගන් සකස් කර අවසන්ව ඇත. |
| **09. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ඉඩම් ලබාදීම**<br><br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>9.1 2025.09.04 දින සේවක ඉඩම් සම්බන්ධයෙන් නීතිපති වෙත යොමු කරන ලද ලිපියට අදාලව නීතිපති ලිපි ගොනු අංක |

| | |
|---|---|
| කොමිෂන් සභා පනතේ 44 (ඕ) වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදන අනුව කොමිෂන් සභාවේ වසර 5ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයින් හට ඉඩම් ලබා දීමේ හැකියාවක් පවතින්නේ ද යන්න පිළිබඳව නීතිපතිවරයාගෙන් කඩිනමින් උපදෙස් ලබා ගැනීම.<br>II. නීතිපතිවරයාගෙන් ලැබෙන උපදෙස් පරිදි අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම. | E/294/25/LRC යටතේ කටයුතු සිදු කරමින් පවතින බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත (ඇමුණුම 04).<br>**වර්තමාන තත්වය**<br>9.1.1 2025.09.04 දින සේවක ඉඩම් සම්බන්ධයෙන් නීතිපති වෙත යොමු කරන ලද ලිපියට අදාලව 2025.10. 29 දිනැති ලිපිය මගින් නීතිපති විසින් සිය මතය දන්වා එවා ඇත<br>9.1.2 ඒ අනුව කොමිෂන් සභාවේ සේවකයන් හට ඉඩම් ලබා දීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 44 (ඕ) වගන්තියේ දක්වා ඇති ප්‍රතිපාදන යටතට නොවැටෙන බව නීතිපති විසින් දන්වා ඇත.<br>9.2 මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ විගණන හා කලමණාකරන කමිටුවේදී ලබා දුන් උපදෙස් සම්බන්ධව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඉදිරි ක්‍රියා මාර්ග ගනු ලැබේ. |

| | |
|---|---|
| **11. එස්.ආර්.රෙන්ගනාදන් මහතාට ඉඩම් ලබාදීම (මාතලේ බෙගසප් වත්ත)**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර, වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහිව නීතිමය සහ විනය පියවර ගැනීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>11.1 2025.07.18 දින මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2019 යටතේ විනය පරීක්ෂණ නිලධර නාමලේඛනයේ නම සඳහන් නිලධාරියෙකු මගින් මූලික විමර්ශනයක් ආරම්භකර ඇත. 2025.10.22 දින විමර්ශන නිලධාරී විසින් ඉදිරිපත් කල වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි තීරණයට අනුව සේවකයින් දෙදෙනෙකුගේ මේ වනවිට වැඩ තහනම් කර ඇත (ඇමුණුම 05).<br>11.2 තවද මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත 2025.11.26 දිනැතිව පැමිණිල්ලක් සිදු කර ඇත (ඇමුණුම 06). |
| **14. වාල්ස් නෙවිල් උදලාගම මහතාට ඉඩම් ලබාදීම (මාතලේ කෝන්ගස්යාය)**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. මේ සම්බන්ධව සිදු කරමින් පවතින පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීම.<br>II. මෙම සිදුවීමට අදාළ ලේඛන වල ආරක්ෂාව සඳහා ගත යුතු සියලු පියවර කඩිනමින් ගැනීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>14.1 කොමිෂන් සභාව විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2019 යටතේ විනය පරීක්ෂණ නිලධර නාමලේඛනයේ නම සඳහන් නිලධාරියෙකු මගින් සිදු කරන ලද විමර්ශන වාර්තාව ඉදිරිපත් කර ඇත.<br>14.2 එම වාර්තාවට අනුව කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරුන් දෙදෙනෙකු, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ තවත් සේවකයෙකු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2025.11.26 දිනැතිව පැමිණිල්ලක් සිදු කර ඇත (ඇමුණුම 07).<br>14.3 ඊට අමතරව මේ හා සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අංක |

| | |
|---|---|
| | 396/25/CM යටතේද පරීක්ෂණයක් පැවැත්වේ.<br><br>14.4 ලේඛන ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු මේ වන විට සලසා ඇත. |
| **15. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ගැසට් පත්‍ර මඟින් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන් පසු එම ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන් පසු එම ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී නීතිමය ගැටලු සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීම අවශ්‍ය වන්නේනම් නව නීති සම්පාදනයකට යොමු වී හෝ මෙම ගැටලු නිරාකරණය කිරීමට අදාළ සියලු ක්‍රියා මාර්ග ගැනීම.<br>II. මෙම ගැටලුව හේතුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අදාළව අධිකරණයේ පවතින නඩු ප්‍රමාණය, වාරණ නියෝග ප්‍රමාණය, අධිකරණයේ තැන්පත් කර ඇති වන්දි මුදල් ප්‍රමාණය පිළිබඳවද තොරතුරු සහ මෙම ගැටලු විසඳීමට අදාළ යෝජනා, නිර්දේශ ඇතුළත් කර අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කිරීම. | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>15.1 කොමිෂන් සභාව විසින් වෙනත් ආයතන වෙත පවරා ඇති ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු සම්බන්ධ වාර්තාව සභාපතිතුමා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම වාර්තාව 2025.10.17 දින අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත (ඇමුණුම 08).<br><br>**වර්තමාන තත්වය**<br>15.2 අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කර ඇති අතර එය කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **16. විකල්ප ඉඩම් ලබා දීමේ බලතල සහ ක්‍රියා පටිපාටිය**<br>**කාරක සභාවේ නිර්දේශ**<br>I. ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා විකල්ප ඉඩම් ලබා දීමේ දී සිදු වී ඇති අවිධිමත් තත්ත්ව සියල්ල සලකා බැලීම.<br>II. ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා විකල්ප ඉඩම් ලබා දීම තවදුරටත් සිදු කළ යුතු ද යන්න | **ගනු ලැබූ ක්‍රියාමාර්ග**<br>16.1 මීට අදාළව නීතිමය බැඳීම් නිදහස් කිරීම සඳහා විකල්ප ඉඩම් ලබා දීම තවදුරටත් සිදු කල යුතුද යන්න සලකා බැලීම සහ තවදුරටත් එසේ සිදු කල යුතු විධිමත් ක්‍රමවේදයක් සැකසීම යටතේ 2025.12.18 දින පැවති කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අංක |

| | |
|---|---|
| සලකා බැලීම සහ තවදුරටත් එසේ සිදු කළ යුතු නම් ඒ සඳහා අනුගමනය කළ යුතු විධිමත් ක්‍රම වේදයක් සකස් කිරීම. | 13234 පත්‍රිකාවේ තීරණය වූයේ,<br><br>16.1.1 නීතිමය බැඳීම් නිදහස් කිරීම වෙනුවෙන් විකල්ප ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීම.<br><br>16.1.2 එම කමිටුවේ සෙසු සාමාජිකයින් ලෙස අමාත්‍යාංශයේ නීති නිළධාරී, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝජිතයෙකු, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු සහ කමිටුවේ කැඳවුම්කරු ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (ඉඩම්) යෝජනා කිරීමටත් තීරණය කරන ලදි.<br><br>16.2 කමිටුව සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ පදනම් කරගත් වැඩ පැවරුමක් කොමිෂන් සභාව විසින් ලබා දිය යුතුය.<br><br>16.3 ඉහත කොමිෂන් සභා තීරණය 2025.12.30 දින ඉදිරි කටයුතු කිරීම සඳහා කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත්කර ඇත (ඇමුණුම 09). |
| 18. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂ වලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ<br>කාරක සභාවේ නිර්දේශ<br>I. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් | යෝජිත ක්‍රියාමාර්ග<br><br>18.1 අදාළ විගණන විමසුම් පිළිබඳ පරීක්ෂා කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධව ඉදිරි පියවර ගනු ලැබේ. |

| | |
|---|---|
| සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් 2025.05.15 දින සහ 2025.07.17 වැනි දිනවල කාරක සභා රැස්වීමේ දී සාකච්ඡාවට ලක් කළ හැකි කරුණු වලට අදාළව, කාරක සභාව ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බවත්, සාකච්ඡාවට ලක් කිරීමට නොහැකි වූ සියලුම කරුණු පිළිබඳව විධිමත්ව පරීක්ෂණ සිදුකර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම.<br>II. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් 2025.05.15 දින සහ 2025.07.17 වැනි දිනවල කාරක සභා රැස්වීමේ දී සාකච්ඡාවට ලක් කළ හැකි කරුණු වලට අදාළව, කාරක සභාව ලබා දුන් නිර්දේශ අනුව සිදු කරන පරීක්ෂණ වාර්තා සහ ඉහත 18(1) නිර්දේශය ප්‍රකාරව සිදු කරන පරීක්ෂණ වාර්තා සියල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | |

කේ. ඩී. ලාල් කාන්ත,

අමාත්‍ය,

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.

2/1/129 - v

2025.11. 06

ලේකම්
කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින්

ලේකම්
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටෙ.

**2025-2029 උපාය මාර්ගික සැලැස්ම**

2025.05.08 හා 2025.07.17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා වූ පරිදි නව රජයේ සිදුවී ඇති දේශපාලනික හා ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම්වලට අනුරූප වන පරිදි සංශෝධනය කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2025-2029 වර්ෂයන්ට අදාළ උපාය මාර්ගික සැලැස්ම 2025.10.08 දිනැතිව කෘෂිකර්ම, ඉඩම්, පශුසම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර ඇත (ඇමුණුම 01).

02. ඒ අනුව, අනුමත කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2025-2029 උපාය මාර්ගික සැලැස්ම අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත යොමු කරන බව කාරුණිකව දන්වමි.

O/C
කුසුම් හේරත්
අධ්‍යක්ෂ (පාලන)

අත්/කළේ:- ආර්. කේ. නිහාල්
සභාපති

ප්‍රගමන පිටපත:-

ලේකම් - කාරුණික දැ.ගැ.ස.
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටෙ.

DG/LRC/2025 3/1/45 2025.07. 08

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාර්මාර්ග අමාත්‍යාංශය මගින්,
ලේකම්
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටෙ.

**2025 මැයි මස 08 වැනි දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරිම - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.**

2021 වසරේ සිට අමාත්‍ය මණ්ඩල තීරණ මත උතුරු මැද පළාත තුල ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නියමු ව්‍යාපෘතිය සම්බන්ධව 2025.06.01 දිනැතිව වාර්තාවක් ඉල්ලා ඇති අතර, ඒ සඳහා සකස් කරන ලද වාර්තාව සහ අංක 01 සිට 21 දක්වා ඇමුණුම් මේ සමග යොමු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

ආර්.කේ.නිහාල්,
සභාපති.

පිටපත් -

01 විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
බත්තරමුල්ල.

02 අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,
මුදල් ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය,
කොළඹ 01.

} දැන ගැනීම සඳහා

31/7/8

1. <u>කාබනික පොහොර මධ්‍යස්ථාන</u>

උතුරු මැද පලාතේ ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නියමු ව්‍යාපෘතියේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන 27 ක සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන 04 ක ක්‍රියාත්මක කර ඇත. ( ඇමුණුම 01)

2. <u>බඳවාගත් සේවකයින් පිළිබඳ තොරතුරු</u>

කාබනික පොහොර ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තාව සහ අමප/21/1225/322/010-1 තීරණය පරිදි සේවකයින් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අංක 11467 සහ 2021.06.18 දිනැති පත්‍රිකාව කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති අතර, අංක 11490 හා 2021.07.08 දිනැති තීරණය පරිදි ව්‍යාපෘති නිලධාරීන් 33 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ( ඇමුණුම 02, 03 හා 04)

එකී තීරණය අනුව බඳවා ගන්නා ලද ව්‍යාපෘති නිලධාරීන් සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2021.08.11 දින ලබා දී ඇත. ( ඇමුණුම 05)

කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට කම්කරු සේවකයින් අවශ්‍ය වූ අතර, එම සේවකයින් කාබනික පොහොර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද ප්‍රදේශ අවටින් බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර, මෙම බඳවා ගැනීමට සඳහා අංක 11502 දරණ කොමිෂන් සභා තීරණය ලබා දී ඇත. කම්කරු සේවකයින් බඳවා ගැනීම සම්බන්ධවද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2021.07.30 දින අනුමැතිය විමසා ඇතත්, ඒ සඳහා බහු කාර්යය සංවර්ධන කාර්ය සාධන බලකායෙන් සපුරා ගන්නා ලෙස දන්වා ඇත. ( ඇමුණුම 06, 07 සහ ඇමුණුම 05 බලන්න)

පසුව අමාත්‍යාංශ ලේකම්තුමා විසින් 2021.09.14 දිනැති කාබනික පොහොර ව්‍යාපෘතියේ තත්ත්වය දන්වමින් නැවත කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත. ( ඇමුණුම 08)

බඳවා ගන්නා ලද ව්‍යාපෘති නිලධාරීන් සහ කම්කරු සේවකයින් පිළිබඳ විස්තර ඇමුණුම 09 හා 10

3. <u>මධ්‍යස්ථාන පිරිවැය</u>

කාබනික පොහොර ව්‍යාපෘතියේ මූල්‍ය කටයුතු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති කාර්යාලය විසින් පවත්වාගෙන ගිය අතර, 2021.12.31 දිනෙන් මූල්‍ය කටයුතු අවසන් කර ඉඩම් අමාත්‍යාංශය වෙත භාර දී ඇත. ඒ අනුව 2021.12.31 දිනට මධ්‍යස්ථාන පිරිවැය සහ 2021.12.31 දිනට මූල්‍ය තොරතුරු මේ සමග අමුණා ඇත. ( ඇමුණුම 11)

4 <u>ගොඩනැගිලි විස්තර</u>

කාබනික පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදන ධාරිතාව ඉහල මට්ටමක පැවති මධ්‍යස්ථාන 10 ක ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අංක 11520 සහ 2021.08.25 දිනැති පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර, ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඊට අදාළ ගොඩනැගිලි පිළිබඳ ලේඛණය සහ තීරණය අමුණා ඇත. (ඇමුණුම 12 හා 13)

**6 උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර**

කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා ගොවි උපකරණ සහ පොහොර නිෂ්පාදනය සඳහා යන්ත්‍ර සූත්‍ර මිළදී ගත් අතර, එම උපකරණ යන්ත්‍ර සූත්‍ර ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය සහ ඇල්ල ප්‍රාදේශීය සභාවට භාර දී ඇත. එහිදි යන්ත්‍රසූත්‍ර අස්ථාන ගත වීම සම්බන්ධව පොලිසියේ පැමිණිලි සටහන් කර ඇති අතර, අස්ථානගතවීම සම්බන්ධව මු.රෙ. 104, 105 අනුව පරීක්ෂා කිරීමටද කමිටුවක් පත් කර ඇත. ඒ සඳහා මෙතෙක් වාර්තාව ලැබී නැත. (ඇමුණුම 14, 15 හා 16)

**7 ආයෝජකයින් පිළිබඳ තොරතුරු**

උතුරුමැද පලාතේ ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නියමු ව්‍යාපෘතිය සඳහා උතුරුමැද පලාතේ කාබනික පොහොර නිෂ්පාදනය කරන ව්‍යවසායකයින් ද සම්බන්ධ කරගෙන ඇති අතර, එවකට තිබූ කාබනික පොහොර ඉල්ලුම සපුරාලීම සඳහා නිෂ්පාදනයින් විසින් නිපදවන ලද අර්ධනිමි පොහොර ද ලබාගෙන ඇත. ඒ සඳහා 2021.06.16 දිනැති අංක 11467 කොමිෂන් තීරණය මගින් ද 2021.10.10 දිනැති අංක 11580 දරණ කොමිෂන් තීරණය මගින් ද කටයුතු කර ඇත. ( ඇමුණුම 17, 18, 19 හා 20)

ඒ අනුව මාකඳුර කෘෂි පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලිත රාජපක්ෂ මහතාගේ නිර්දේශ සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සහිතව මිළදී ගැනීමට තීරණ ලබා දී ඇති අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අදාළ මිළ ගණන් ලබා දී ඇත. ඒ අනුව මිළ ගණන්, ප්‍රමාණ හා පුද්ගල තොරතුරු ඇමුණුම 21 හා 22 දක්වා අමුණා ඇත.

එසේම කාබනික පොහොර නිෂ්පාදනය, දිස්ත්‍රික් මට්ටමින් දිරි ගැන්වීම සඳහා ඉඩම් කොටස් කිහිපයක් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන ප්‍රකාරව බදු දීමට කටයුතු කර ඇත. ඒ සම්බන්ධව ඉඩම් කොමිෂන් සභාවේ ව්‍යාපෘති අංශය විසින් කටයුතු කරනු ලබන අතර, වර්තමාන තත්ත්වය ලබා ගැනීම සඳහා වාර්තා ද කැඳවා ඇත.

සකස් කලේ -

ලියනගේ පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග
අමාත්‍යාංශය
[illegible]
Ministry of Agriculture, Livestock, Land and Irrigation

ඉඩම් අංශය
[illegible]
Land Section

[illegible]
"Mihikatha Medura", Land Secretariat, No. 1200/6, Rajamalwatta Avenue, Battaramulla

මගේ අංකය / My No. } 3/1/45(IV) | ඔබේ අංකය / Your No. } | දිනය / Date } 2025.10.[illegible]

1. [illegible] මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක (ඉඩම් අංශය) - සභාපති
2. [illegible] මිය, සහකාර ලේකම් (ඉඩම්) - සාමාජික
3. [illegible] රණසිංහ මිය, ගණකාධිකාරී (ඉඩම් අංශය) - සාමාජික

<u>COPE කමිටුව මඟින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම</u>

ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් COPE කමිටුව මඟින් ලබා දී ඇති නිර්දේශ පරිදි අදාළ පරීක්ෂණ පැවැත්වීමට කමිටුවේ සභාපති / සාමාජික වශයෙන් ඔබව පත්කරමි. කරුණාකර අදාළ පරීක්ෂණ කටයුතු සිදු කර වාර්තාව මා වෙත ලබා දීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

02. (I) නිර්දේශ අංක : 6.3 - 2025/07/17 - මාලනී නානායක්කාර මහත්මියට ඉඩම් ලබා දීම - [illegible], කටාන
(II) [illegible] මහතාට ඉඩම් ලබාදීම ([illegible]) - අනු අංකය - 6.2
(III) නිර්දේශ අංක : 09 - 2025/07/17 - [illegible] අක්කර 25 ක් ලබා දීම

03. අදාළ කෝප් කමිටු වාර්තාවේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරන අතර [illegible] අදාළ වාර්තා 2025/11/30 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කිරීම [illegible] ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

[illegible]
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා
වාරිමාර්ග අමාත්‍යාංශය

පිටපත: [illegible]

මගේ අංකය
எனது இல.
My No. } E/294/2025/LRC

ඔබේ අංකය
உமது இல.
Your No. } 2/1/272/ (VII)

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. } 2147886, 2433967, 2320800, 2327919, 2149001(2)

ඉලෙක්ට්‍රොනික් තැපැල
மின் அஞ்சல்
E-mail } administration@attorneygeneral.gov.lk

ෆැක්ස්
தொலைநகல்
Fax } 2436421

තැ.පෙ.අංකය
அஞ்சல் பெட்டி
P.O. Box No. } 502

කොළඹ 12.
கொழும்பு 12.
Colombo 12.

# නීතිපති දෙපාර්තමේන්තුව
# சட்டமா அதிபர் திணைக்களம்
# ATTORNEY - GENERAL'S DEPARTMENT

2025.10.29

0 6 NOV 2025

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

11 NOV 2025

ඉඩම් පැවරීම් අංශය

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.**

උක්ත විෂයගත කරුණට අදාලව ඔබ විසින් යොමු කරන ලද 2025.09.04 දිනැති ලිපිය හා බැඳේ.

එලෙස, ඔබ විසින් උපදෙස් ඉල්ලා ඇත්තේ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 44 (ඕ) වගන්තියේ ප්‍රතිපාදන අනුව කොමිෂන් සභාවේ වසර 05 ක අඛණ්ඩව සේවයක් හිමි සේවකයින් හට ඉඩම් ලබාදීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳවයි.

එකී පනතේ 2 වගන්තියෙහි පනතෙහි අරමුණු පිළිබඳ පහත ප්‍රතිපාදන දක්වා ඇත,

**The purpose of this Law Shall be to establish a Land Reform Commission with the following objects:-**

**(a) to ensure that no person shall own agricultural land in excess of the ceiling ; and**

**(b) to take over agricultural land owned by any person in excess of the ceiling and to utilize such land in a manner which will result in an increase in its productivity and in the employment generated from such land.**

තවද, එකී පනතේ 44 වගන්තිය පහත පරිදිද,

**44. The Commission shall have such powers as may be necessary or expedient to achieve its objects and in particular it may:**

එකි වගන්තිය යටතේ දක්වා ඇති 44 (ඔ) [44 (*i*)] වගන්තිය පහත පරිදිද ප්‍රතිපාදන දක්වා ඇත,

**(*i*) establish a provident fund and provide welfare and recreational facilities, houses, hostels and other accommodation, for persons employed by the Commission.**

එලෙස, ඉහත 44(ඔ) වගන්තිය හරහා දක්වා ඇති "**houses, hostels and other accommodation**" යන්නෙන් ගම්‍ය වන්නේ කොමිෂන් සභාවේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා එහි සේවකයන් හට ඔවුන්ගේ රාජකාරි කටයුතු සිදු කිරීමේදී සැපයිය යුතු පහසුකම් සම්බන්ධව අන්තර්ගත කොට ඇති බවයි.

ඒ අනුව, එකී පනතේ ඉහත දැක්වූ වගන්තියෙහි දක්වා ඇති කොමිෂන් සභාවේ අරමුණු ප්‍රකාරව සහ ඉහත 44(ඔ) වගන්තියේ "**other accommodation**" (වෙනත් ඉඩකඩ) යන වචනය අර්ථ නිරූපන රීති ප්‍රකාරව අර්ථ නිරූපනය කිරීමේදී, 'වෙනත් ඉඩකඩ' යන්නෙහි අර්ථය එකී වචනයට පෙර ඇති නිශ්චිත වචනවලට සමානව හා එකී වචනවලට සීමාවී අර්ථ නිරූපනය විය යුතු හෙයින්, ඔබ විසින් ඔබගේ ලිපියෙන් ඉල්ලා ඇති පරිදි ඔබ කොමිෂන් සභාවේ සේවකයින් හට ඉඩම් ලබා දීම, එකී 44 (ඔ) වගන්තියේ දක්වා ඇති ප්‍රතිපාදන යටතට නොවැටෙන බව මාගේ මතය වේ.

ඇන්ජලෝ වැන්හොෆ්,
රජයේ අධිනීතිඥ,

අත්/කළේ: රජිත පෙරේරා,
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්,
නීතිපති වෙනුවට.

PR/ E-294-2025-LRC-le

නි./ස. අධ්‍යක්ෂ (ඉ.පැ./ඉ.උ.සී./ව්‍යාපෘති/
මැනුම්/තක්සේරු/ අත්. හා රා.ආ./ඔප්පු)
..........................................
..........................................
..........................................
..........................................
..................
අධ්‍යක්ෂ (ඉඩම්)

[redacted]

144

ඉප්‍රකො/ලේ/විමර්ශන /182

2025.11.26

අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
තැ.පෙ.1431,අංක 36
මලලසේකර මාවත
කොළඹ 07.

<u>විශේෂ අංක මහ / 403 ගොණුවේ ප්‍රකාශක වෙත වැරදි ආකාරයෙන් නැවත ඉඩම් ලබා දීම.</u>

උක්ත කරුණ සම්බන්ධ මගේ සමාංක හා 2025.07.25 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. උක්ත ලිපිය මගින් ඔබ වෙතද යොමු කරන ලද ගරු ඉඩම් හා වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් විසින් සභාපතිතුමා වෙත යොමු කරන ලද DM/1/3/-(7/1) හා 2025.07.03 දිනැති ලිපිය අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2019, විනය පරීක්ෂණ නිලධර නාම ලේඛණයේ නම් සඳහන් විමර්ශන නිලධාරි එම්.ටී. දිසානායක මහතා විසින් මූලික විමර්ශනයක් සිදු කර ලබා දුන් මූලික විමර්ශන වාර්තාව (ඇමුණුම 1) ඔබගේ විමර්ශන කටයුතුවලට සහය කර ගැනීම සඳහා මේ සමග ඔබ වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

03. තවද මෙම මූලික විමර්ශන වාර්තාව 2025.11.19 වන දින පවත්වන ලද 823 වැනි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කරන ලදුව විමර්ශන නිලධාරි එම්.ටී. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත (කොමිෂන් පත්‍රිකාව හා තීරණය ඇමුණුම 2 හා 3).

04. ඒ අනුව, මේ වන විට ඉඩම් උපරිම සීමා අංශයේ සේවය කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒ.එච්. කුමුදු ධර්මප්‍රිය මහතා සහ කළමනාකරණ සහකාර මාලා ස්වර්ණපාලි වල්පිට මෙනෙවියගේ රාජකාරි වැඩ තහනම් කර ඒ බව දැනුම් දී ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.කේ.නිහාල්
සභාපති

19 NOV 2025
1377
ඉඩම් උපරිම සීමා අංශය


# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. • த. பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7. • P.O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2596365, 2596360/1954 ෆැක්ස් / பெக்ஸ் / Fax: 2595045


මගේ අංකය: AC/3846/2025
ඔබේ අංකය: ඉප්‍රකො/ලේ/විමර්ශන/182

2025.11. 05

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
නො.475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

**විශේෂ්‍ය අංක මහ /403 ගොනුවේ ප්‍රකාශක වෙත වැරදි ආකාරයෙන් ඉඩම් ලබා දීම සම්බන්ධවයි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2025.07.25 දිනැතිව මෙම ආයතනය වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ,

02.ඒ අනුව ගරු ඉඩම් හා වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්ගේ 2025.07.03 ලිපියේ අංක: 01 හා 02 ඡේදයේ සඳහන් පරිදි මූලික විමර්ශනයක් සිදු කර අදාල විනය ක්‍රියා මාර්ග ගෙන ඒ සම්බන්ධයෙන් වාර්තාවක් අප වෙත යොමු කරන මෙන් කොමිෂන් සභාවේ නියෝගය පරිදි කාරුණිකව දන්වමි.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ.පී.ලැනරෝල්.
ලේකම්.

காணிச் சீர்திருத்த ஆணைக்குழு
LAND REFORM COMMISSION

අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.
இல. 475, கடுவெல வீதி, பத்தரமுல்லை.
No. 475, Kaduwela Road, Battaramulla.

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 011 214 4795

විශේෂ ඇමතුම් ඒකකය / விசேட அழைப்பு பிரிவு / Special Calling Unit 1931

මගේ අංකය / எனது இல. / My No. ඉප්‍රකො/ලේ/විමර්ශන/182

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி 2025.07.25

අධ්‍යක්ෂ ජනරාල්,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
තැ.පෙ.1431,අංක 36,
මලලසේකර මාවත,
කොළඹ 07.

**විශේෂ අංක මහ /403 ගොණුවේ ප්‍රකාශක වෙත වැරදි ආකාරයෙන් නැවත ඉඩම් ලබා දීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් විසින් මා වෙත යොමු කරන ලද අංක DM/1/3-(7-1) හා 2025.07.03 දිනැති ලිපිය හා බැඳේ. එහි පිටපතක් මේ සමග අමුණා එවමි. (ඇමුණුම 01)

02. මෙම කරුණ සම්බන්ධයෙන් පහත සඳහන් නීතිමය පසුබිම තුළ විමර්ශනයක් සිදු කිරීම සඳහා අදාළ ලේඛණ ඔබ වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

- වරින් වර සංශෝධිත 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 48 වන වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ සියලුම නිලධරයන් සහ සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.
- එසේම, එම පනතේ 49 වන වගන්තිය ප්‍රකාර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගතයුතු බවද, දක්වා ඇත.

03. තවද, කොමිෂන් සභාවට හිතැති සේවක එකමුතුවක කැඳවුම්කරු විසින් ගරු ඉඩම් හා වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා වෙත යොමු කරන ලද 2025.03.20 දිනැති ලිපියකට අනුව,මෙම කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පරීක්ෂණයකට අදාළව ගරු ඉඩම් හා වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා වෙත යොමු කරන ලද අංක මහ/403 හා 2025.05.30 දිනැති වාර්තාවක පිටපතක් ඔබගේ විමර්ශන කටයුතු වලට සහය කර ගැනීම සඳහා මේ සමග අමුණා එවමි. (ඇමුණුම 02)

ආර්.කේ.නිහාල්
සභාපති

ආර්.කේ. නිහාල්
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

පිටපත:- වෛද්‍ය සුසිල් රණසිංහ මැතිතුමා
ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය
ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය.
} ඔබේ අංක DM/1/3-(7-1) හා 2025.07.03 දිනැති ලිපිය අනුව කාරුණික දැන ගැනීම සඳහා.

සභාපති / தவிசாளர் / Chairman  Chairman@lrc.gov.lk
විධායක අධ්‍යක්ෂ / நிறைவேற்று இயக்குனர் / Executive Director  011 287 8005  ed@lrc.gov.lk
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No.  011 287 8052

180

ඉප්‍රකො/ලේ/විමර්ශන /174

2025.11.26

නියෝජ්‍ය පොලිස්පති
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
කොළඹ 1.

2

**මාලේ / 81 ලිපි ගොණුව පිළිබඳ මූලික විමර්ශනය**

ගරු ඉඩම් හා වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් විසින් එවා ඇති අංක LAND/DM/LRC-002/2025/1/307 හා 2025.01.30 දිනැති ලිපියෙන්, මාලේ/ 81 ලිපි ගොණුව පිළිබඳ විශේෂ තොරතුරු ලැබී ඇති බැවින් මෙම ගොණුව සම්බන්ධ ස්වාධීන විමර්ශන නිලධාරියෙකු මගින් විමර්ශනයක් සිදු කොට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු සිදු කරන ලෙසටත්, මූල්‍ය වංචාවක් සිදුවී ඇත්නම් අදාළ ආයතන වෙත වාර්තා කරන ලෙසත්, විමර්ශන වාර්තාව ගරු ඉඩම් හා වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත ලබා දෙන ලෙසත් දැනුම් දී ඇත.

02. ඒ අනුව, මෙ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2019 (III), විනය පරීක්ෂණ නිලධර නාම ලේඛණයේ නම් සඳහන් විමර්ශන නිලධාරි එන්.ආර්. එම්.ධර්මසිරි මහතා විසින් මූලික විමර්ශනයක් සිදුකර ඇති අතර එම මූලික විමර්ශන වාර්තාව (ඇමුණුම 1) මේ සමග ඔබ වෙත යොමු කරමි.

03. එම මූලික විමර්ශන වාර්තාව 2025.11.19 වන දින පවත්වන ලද 823 වැනි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කරන ලදුව කොමිෂන් සභාව විසින් එම විමර්ශන වාර්තාවේ සඳහන් 8.1 සිට 8.6 දක්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. (කොමිෂන් පත්‍රිකාව හා තීරණය ඇමුණුම 2 හා 3).

04. උක්ත විමර්ශන වාර්තාවේ 8.5 නිර්දේශය, "අනාවරණය වී ඇති කරුණු අනුව කොමිෂන් සභාවේ හිටපු සභාපති නීතිඥ නිලන්ත විජේසිංහ, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලියනගේ පත්මසිරි මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂක ඒ.එච්. කුමුදු ධර්මප්‍රිය මහතා, කළමනාකරණ සහකාර පී.එම්.බී. ශෂික මතුරංග මහතා, ප්‍රියංගි ලියනාරච්චි මිය සහ කොමිෂන් සභා සාමාජික පණ්ඩුකාභය හර්ෂ කීර්තිනන්ද මහතා, යන අය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර, අපරාධ නීතියට අනුව ඔවුන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීම " ලෙස සඳහන් කර ඇත.

05. ඒ අනුව උක්ත විමර්ශන වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් ඔබ දෙපාර්තමේන්තුව මගින් විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

O/C

ආර්.කේ.නිහාල්
සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
காணிச் சீர்திருத்த ஆணைக்குழு
LAND REFORM COMMISSION

අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.
இல. 475, கடுவெல வீதி, பத்தரமுல்ல.
No. 475, Kaduwela Road, Battaramulla.

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 011 214 4795
ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No. 011 287 80

මගේ අංකය / எனது இல. / My No. ඉප්‍ර/4/කමිටු සාකච්ඡා

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025.10. 17

ලේකම්
කෘෂිකර්ම පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
මිහිකත මැදුර
මහලේකම් කාර්යාලය
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

<u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ගැසට් පත්‍ර මගින් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන්පසු එම ඉඩම් වල අයිතිය සම්බන්ධයෙන් පැනනැගී ඇති ගැටළු</u>

ශීර්ෂගත කරුණට බැඳිව 2025.07.17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 17 වැනි රැස්වීම් වාරයේදී දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡාවට බඳුන් විය.

02. ඒ අනුව කාරක සභාව විසින් නිර්දේශ කර සිටියේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන්පසු එම ඉඩම් වල අයිතිය සම්බන්ධයෙන් පැනනැගී ඇති නීතිමය ගැටළු සම්බන්ධව නීති විශාරදයන්ගේ උපදෙස් ලබා ගැනීම සහ නව නීති සම්පාදනයකට යොමු වී හෝ මෙම ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගතයුතු බවය.

03. ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පහත සඳහන් කරුණු වාර්තා කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**සිද්ධිමය හා නීතිමය පසුබිම**

04. වරින්වර සංශෝධිත 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 3(2) හා 42(අ) වගන්තිය ප්‍රකාරව ඉඩම් හෙක්ටයාර 743,468.24 පමණ ප්‍රමාණයක් කොමිෂන් සභාව සතු වී ඇත. එසේ කොමිෂන් සභාව සතු වූ ඉඩම් වලින් සැළකිය යුතු ඉඩම් ප්‍රමාණයක් තේ, පොල්, රබර් සහ වෙනත් වාණිජ බෝග සහිත ඉතා හොඳ මට්ටමින් පැවති කෘෂිකාර්මික වතු ඉඩම් විය. ඒ අනුව 1972 මැයි මස 29 දින අක්කර 400 ට වඩා විශාල වතු ඉඩම් පාලනය හා කළමනාකරණය කිරීමේ පහසුව සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත භාර දීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ඇති කර ගන්නා ලදී. අනතුරුව වරින් වර සංශෝධිත 1958 අංක 04 දරණ පනතින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතද , වරින් වර සංශෝධිත 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය ප්‍රකාර සංස්ථාගත ආයතනයක් වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙතද පාලනය හා කළමනාකරණය සඳහා එම ඉඩම් භාර දීමට ක්‍රියා කර ඇත. පසුව 1979 අංක 49 දරණ සංශෝධන පනත ප්‍රකාරව පෙර කී වැවිලි සංස්ථා පනතේ 5(අ) වශයෙන් අලුත් වගන්තියක් ඇතුලත් කරන ලද අතර එම සංශෝධනයට අනුව රජය විසින් හෝ වෙනත් තැනැත්තෙක් විසින් පෙර කී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත සතු කරන්නාවූද හිමි කරන්නාවූ ද කෘෂිකාර්මික හා වතු ඉඩම් කළමනාකරණය කිරීමේ බලය පමණක් එම සංස්ථාව වෙත ලබා දීමේ විධිවිධාන සලසා දෙන ලදී.

2025/10/21



සභාපති / தலைவர் / Chairman } chairman@lrc.gov.lk
වෙබ් / විද්‍යුත් තැපැල / இணையம் / மின்னஞ்சல் முகவரி / Web / E-mail } lrc.gov.lk info@lrc.gov.lk
විශේෂ ඇමතුම් ඒකකය / விசேட அழைப்பு பிரிவு / Special Calling Unit } 1931

6/1 නීතිමය බැඳීම

2025.12. 30

ලේකම්,
කෘෂිකර්ම , පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,
ඉඩම් අංශය,
"මිහිකත මැදුර"
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6,රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**නීතිමය බැඳීම් නිදහස් කිරීම සඳහා විකල්ප ඉඩම් ලබාදීම තවදුරටත් සිදු කලයුතුද යන්න සලකා බැලීම සහ තවදුරටත් එසේ සිදු කලයුතු නම් ඒ සඳහා අනුගමනය කල යුතු විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.**

2025.07.17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විකල්ප ඉඩම් ලබාදීමේ බලතල හා ක්‍රියාපටිපාටියට අදාලව කරුණු සාකච්ඡාවිය. එහිදී 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන අනුව ප්‍රකාශකයකුට ව්‍යවස්ථාපිත නිශ්චය වශයෙන් හිමිවන ඉඩම් කොටස වෙනුවට වෙනත් විකල්ප ඉඩමක් ලබාදීමේ බලතල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවතින්නේද යන්න සම්බන්ධයෙන් කරුණු විමසීමක් කරන ලදී. "ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා විකල්ප ඉඩම් ලබාදීම තවදුරටත් සිදුකල යුතුද සලකා බැලීම සහ තවදුරටත් එසේ සිදුකල යුතු නම් ඒ සඳහා අනුගමනය කලයුතු විධිමත්. ක්‍රමවේදයක් සකස් කිරීම." කලයුතු බව පොදු ව්‍යාපාර කාරක සභාවේදී නිර්දේශ කරන ලදී.

02.මෙ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය වූයේ ඉහත කරුණ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමටය.

03.ඒ අනුව 2025.12.18 පැවති 824 කොමිෂන් සභා වාරයට පත්‍රිකා අංක 13234 යටතේ කරුණු ඉදිරිපත් කල අතර එහිදී පහත සඳහන් තීරණයන් ගන්නා ලදී. (පිටපත ඇමුණුම් 01)

I. නීතිමය බැඳීම් නිදහස් කිරීම වෙනුවෙන් විකල්ප ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා,රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමට ඉල්ලීමක් කිරීමටත්,

II. එම කමිටුවේ සෙසු සාමාජිකයින් ලෙස අමාත්‍යාංශයේ නීති නිලධාරී, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝජිතයෙකු, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු

සහ කමිටුවේ කැඳවුම්කරු ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (ඉඩම්) යෝජනා කිරීමටත් තීරණය කරන ලදී.

III. කමිටුව සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ පදනම් කරගත් වැඩ පැවරුමක් කොමිෂන් සභාව විසින් ලබාදීය යුතුය.

04. ඉදිරි කටයුතු සඳහා කොමිෂන් සභාව විසින් ගත් ඉහත තීරණය ඔබ වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

O/C

ආර්.කේ.නිහාල්
සභාපති